මගේ ප්‍රධාන භාවනාවට පෙර ඊට සුදුසු මානසික පසුබිම සකස් කිරීම සඳහා යි චතුරාරක්ඛ භාවනාවේ යෙදෙන්නේ. මෙය සැබෑවක්. එකවරට ම ප්‍රධාන භාවනාව ඇරැඹීමට වඩා කෙටියෙන් භාවනා හතරක යෙදීම ශාන්ත, නිවුණු සිතක් ඇති වීමට හේතු වෙනවා. ශාන්ත නිවුණු සිතේ ප්‍රධාන භාවනාව ඉතා හොඳින් වැඩෙන වග මා අත්දැකීමෙන් ම දන්නවා.

මුලින් මා කරන්නේ බුදු ගුණ භාවනාව "නමාමි බුද්ධං ගුණ සාගරන්තං....."

ගුණ සාගරයක් වූ බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! බුදු ගුණ සාගරයක් වගෙයි; අනන්තයි. බුදු ගුණ සිතා, කියා, ලියා නිම කළ නොහැකියි; සාගරයක් වගෙයි; අනන්තයි.

මම ප්‍රධාන බුදු ගුණ නවයෙන් එකක් ඉතා කෙටියෙන් සිහි කරනවා.

ඒ අරහං ගුණය.
සියලු කෙලෙස් කෙරෙන් දුරු වුණු, රහසින් වත් පව් නොකළ, දෙවියන් බඹුන් ඇතුළු සියලු ලෝක සත්ත්වයන්ගේ පූජාවට සුදුසු වූ මාගේ බුදු පියාණන් වහන්සේ ඒ ගුණ නිසා ම අරහං නම් වන සේක. උන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

මෙසේ සිතන විට මාගේ සිත තුළ, පන්සලේ බුදු මැඳුරේ වැඩ සිටින ලොකු බුදු පිළිම වහන්සේ මැවෙනවා. සමාධිගතව නිවී සැනසුණු මුහුණින් යුතු ඒ බුදු පිළිමය මම සිතින් දකිමි. සාදු! සාදු!!

සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවුණු බුදු පියාණෝ!

කෙලෙසුන් කියන්නේ සිත කිලිටි කරන දේවල්, රාගය, ද්වේෂය, මෝහය එයින් ප්‍රධානයි. මාගේ බුදු පියාණන් වහන්සේ රාගයෙන් මිදලා, ද්වේෂයෙන් මිදිලා, මෝහයෙන් මිදිලා.

රාගය කියන්නේ පංචස්කන්ධ ධර්මයන් පිළිබඳ ඇලීම, ඒවා පිළිබඳ බැඳීම, ද්වේෂය කියන්නේ තරහව, මෝහය කියන්නේ මෝඩකම, අවිද්‍යාව, චතුරාර්ය සත්‍යය නොදැනීම.

බුදු පියාණන් වහන්සේ ඒ සියල්ලගෙන් ම මිදුණා.

මාගේ බුදු පියාණන් වහන්සේ රාගයෙන් මිදුණා. ද්වේෂයෙන් මිදුණා. මෝහයෙන් මිදුණා.

මම සිතින් නිශ්ශබ්ද ව සිටිමි. බුදු රජාණන් වහන්සේ මගේ සිත තුළ බැබළෙනවා. මගේ බුදු පියාණන් වහන්සේ බුදු වීමට පෙර විසිනව වසරක් ගිහියකු වශයෙන් ගෙවූ ජීවිතය මට පෙනෙයි.

එතුමා ගිහි කාලයේ සිදුහත් සිදුහත් රාජකීය පවුලක කෙනෙක්. රජකුගේ පුතෙක්, ඍතු තුනට ගැළපෙන පරිදි මහා මාළිගා තුනක අතිශය සුඛෝපභෝගී ජීවිතයක් ගෙවූ කෙනෙක් යොවුන් වියේ දීම රජ වුණා. සුරූපී ළඳක් බිසව වුණා. දුකක් නොදැක ගෙවුණු ඒ ජීවිතය එතුමා අත්හැරියා. කිසිම ඇලීමක් නැතිව බැඳීමක් නැතිව ඒ සුඛෝපභෝගී ජීවිතය, සුරූපී බිරිය මහා මාළිගා සම්පත් සියල්ල ඇලීමක් බැඳීමක් නැතිව අත්හැරියා. රන් මිරිවැඩි ගළවා රළු බොරළු පස මත සිනිඳු මොළොක් පාද තබා පීඩාකාරී දුක්බර ජීවිතයක් සිය කැමැත්තෙන්ම තෝරා ගත්තා. මහ මග සිගා යමින් පාත්‍රයට වැටෙන දෙයකින් කුසගිනි නිවා ගත්තා. සය වසරක් අනන්ත දුක් පීඩා මැද දුෂ්කර ක්‍රියාවල යෙදෙමින් උන් වහන්සේ ආර්ය සත්‍යය සොයා වෙහෙසුණා. අවසානයේදී වෙහෙසේ ඵල ලැබුණා. සම්මා සම්බුද්ධත්වයට පත් වුණා.

මාගේ බුදු පියාණන් වහන්සේ බුදු වීමට පෙර ගිහි ජීවිතය අවසන් කළේ ඇලීමෙන් බැඳීමෙන් රාගයෙන් තොරවයි.

බුදු වූ පසුද උන් වහන්සේට සැප සම්පත් ගලා ආවා. ජේතවනාරාමයේ වටිනාකම මසුරන් කෝටි පනස්හතරයි. පූර්වාරාමයේ වටිනාකම මසුරන් කෝටි විසිහතයි. වේළුවනාරාමය, නිග්‍රෝධාරාමය, කූටාගාර සාලාරාමය, රාජකාරාමය, ඝෝෂිතාරාමය, ආදී සියලු පහසුකමින් සපිරුණු ආරාම ද මහ මැඳුරු විය. ජේතවනාරාම ගඳ කුටියේ පා පිස්නේ අගය මසුරන් ලක්ෂයක්. ඒ සියල්ල මාගේ බුදු රජාණන් වහන්සේ පරිහරණය කලේ ඇලීමෙන් තොරවයි. බැඳීමෙන් තොරවයි.

උන් වහන්සේ ඒ ආරාමවල වැඩ විසුවේ වස්සාන කාලයේ පමණයි. අනෙක් කාලවල ගත කලේ මහ පාරේ ගස්යට, ගල් තලාවල, ගල් ගුහාවල, රළු බොරළු පාරේ පාවහන් නැතිව උන් වහන්සේ වැඩම කළා. ගිනිකාෂ්ටක අව්වේ, මහ වැස්සේ වැඩම කළා. සෝපාක කුඩා දරුවා රැහැන්වලින් මුදාගැනීමට සොහොනට වැඩම කලේ අංගුලිමාල මව මරා අපාගත වීමෙන් වළක්වා ගැනීමට වනාන්තරයට වැඩම කලේ සීතල පින්නට තෙමෙමන් අලුයම් කාලයේ.

ඇලීමෙන්, බැඳීමෙන්, තොර වූ මාගේ බුදු පියාණන් වහන්සේ ඒ සියලු දුක් පීඩා උපේක්ෂාවෙන් විඳ දරාගත්තා. දුටු දුටු අය කාමයෙන් මුසපත් කරවන තණ්හා, රතී, රඟා දිව්‍ය කුමාරිකාවන් උන් වහන්සේට පෙනුණේ අසූචි වළක නළියන පණුවන් වගෙයි. මාගන්දි රූප සුන්දරිය උන් වහන්සේගේ ඇසට පෙනුණේ අසූචි පිරුණු ගබඩාවක් වගෙයි. රාගය මුළුමනින්ම තුරන් කළ මාගේ බුදු පියාණන් වහන්සේ මහ රජුන්ගෙන් සිටුවරුන්ගෙන් දිව බොජුන් පරයන ප්‍රණීත ආහාර - පාන ලැබුවා. එහෙත් උන් වහන්සේ ඒ ප්‍රණීත බව සමග බැඳුණේ නැහැ. මහ මග සිඟා ගොස් පාත්‍රයට ලැබෙන රොටි කෑල්ලෙන් යැපුණු දවස් බොහෝමයි. කොසොල් රජුගේ අසදෘශ මහා දානයත්, දුප්පතකුගෙන් ලැබෙන රොටී කැල්ලත් උන් වහන්සේට සමානයි. තුන් මාසයක්ම බුදු රජාණන් වහන්සේ වැළඳුවේ අශ්වයන්ට දෙන යව නමැති ධාන්‍ය වර්ගයයි.

ඇලීමක්, බැඳීමක් නැති නිසා එයින් ඒ සිතට කම්පාවක් ඇති වුණේ නැහැ.

ඇලීමක් බැඳීමක් නැති තැන ගැටීමක් ඇති වන්නේ නැහැ. ද්වේෂයක් ඇති වන්නේ නැහැ.

ඉතින් ඇලීමෙන් ගැටීමෙන් තොර බුදු පියාණන් වහන්සේ ද්වේෂයෙන් තොර වීම අමුතුවෙන් කිව යුත්තක් නොවෙයි. දඹදිව අනෙක් ආගම්වල පුජකවරු, ශාස්තෘවරු සහ ඔවුන්ගේ අනුගාමිකයන් බුදු රජාණන් වහන්සේට අවමන් කළා. නින්දා කළා. උන් වහන්සේ විනාශ කිරීමට කුමන්ත්‍රණය කළා. මාගන්දි මැරයන් කුලියට ගෙන බුදු රජාණන් වහන්සේටත් මහා සංඝයාටත් වීදිවල දී අපහාස කෙරෙව්වා.

චිංචි මානවිකාව, සිරිමා ගණිකාව යොදාගනිමින් උන් වහන්සේගේ චරිතයට මඩ ගැසීමට තිර්ථකයන් උත්සාහ කළා. දේවදත්ත දුනුවායන් ලවා සුරාවෙන් මත් වූ ඇතුන් ලවා බුදුරජාණන් වහන්සේ නැසීමට උත්සාහ කළා. බැරිම තැන ඔහු ගිජුකුළු පව්වට නැග ගල් පෙරලා බුදු රදුන්ගේ සිරිපතුලේ ලේ සෙලෙව්වා.

අනේ ඒ හැම අවස්ථාවකදීම උන් වහන්සේ කම්පාවට පත් වුයේ නැහැ. සතුරන් පිළිබඳව තරහක් වෛරයක් උන් වහන්සේගේ සිතට නැගුණේ නැහැ. සුපුරුදු මෛත්‍රියම ඔවුන් වෙතද ගලා ගියා.

ලක්ෂ සංඛ්‍යාත සංඝ සමාජයක් උන් වහන්සේ නිසා ගොඩ නැගුණා. විවිධ චරිත ඒ සමාජයේ දක්නට ලැබුණා. උන් වහන්සේ කම්පාවෙන් තොරව ඒ අයට සසර ජය ගැනීමේ මග කියා දුන්නා. කිසිම ගැටීමක් ඇති වුයේ නැහැ. රාගයෙන් ද්වේෂයෙන් තොරවූ මාගේ බුදු පියාණන් වහන්සේ මෝහයෙන්ද තොර වුණා.
මෝහය යනු අවිද්‍යාව, මෝඩකම, චතුරාර්ය සත්‍යය නොදත්කම. මේ අවිද්‍යාව නිසයි සංසාරේ අප මෙතෙක් කල් ගමන් කලේ. එදා වෙසක් පුර පසලොස්වක පොහොය දා ගයාවේ ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේ සෙවණේ දී උන් වහන්සේ අවිද්‍යාවට හේතුව වූ තණ්හාව හඳුනාගත්තා. තණ්හාව දුරු කලා. ඒ සමග ම අවිද්‍යාව දුරු වුණා මෝහය දුරු වුණා. සසර ගමන හමාර වුණා. බුද්ධත්වයට පත් වුණා. ඉන් පසු ලෝක සත්ත්වයාද මෝහයෙන්, අවිද්‍යාවෙන් මුදාගැනීමට උන් වහන්සේ සිය ජීවිතය කැප කලා. දවසකට පැය දෙක්ක පමණ සැතපෙමින් සතළිස් පස් වසරක් පුරා මාගේ බුදු රජාණන් වහන්සේ අපරිමිත කරුණාවෙන් යුක්තව අපගේ මෝහය දුරු කිරීමට ශ්‍රී සර්ධර්මය දේශනා කලා. රාග, ද්වේෂ, මෝහ යන කෙලෙසුන් කෙරෙන් දුරු වුණු බුදු පියාණන් වහන්සේට මාගේ ජීවිතය පුජා කරමි. පුජා වේවා! පුජා වේවා!
බුදු පියාණන්ට පුජා කරන්නේ පිරිසිදු දෙයක්. මලක් නෙළා පුජා කරන්නේ පිරිසිදු පැන් ඉසීමෙන් පසුයි. මම මගේ ජීවිතය උන් වහන්සේට පුදනවා නම් එයද පිරිසිදු විය යුතුයි. රාගය ද්වේෂය නැති විය යුතුයි.

මගේ සිතේ වූ බුදු රුව මහ රැස් දහරාවකින් වැසිණ. මගේ සිතට මහා සුවයක් දැනෙන්නට විය.

මා සිහි කළේ ඒ ගුණ සාගරයෙන් බිඳක් අරහං ගුණයෙනුත් බිඳක්. ඒ ගුණ මගේ සිතට ද කාන්දු වෙනවා වාගේ මට දැනෙනවා. නිකම්ම බුදු ගුණ නවය සිතෙන් කීමෙන් පලක් නැහැ. ඒ ගුණට අදාළ සිදුවීම් මෙනෙහි කිරීමෙන් වඩාත් පහසුවෙන් ඒ ගුණ සමග එකතු විය හැකියි බුදු ගුණ භාවනාවෙන් සිදු විය යුත්තේ එයයි. එ ගුණ වලින් බිඳක් හෝ තමා තුළට ද එකතු විය යුතුයි.

මෛත්‍රී භාවනාව ලබන කළාපයේ

සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au